# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2065/46 – 2018 අප්‍රේල් 06 වැනි සිකුරාදා – 2018.04.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, පාලටුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංකඃ එම්ආර්/එම්එල්එම්/ආර්ඩීඒ/2017/496 හා 2017.11.16 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – නුගදූගොඩ හෙවත් නුගදූව – ප්‍රමාණය: හෙක්. 0.6867**

උතුරට: ඩබ්ලිව්. ටී. නාලක සමන් හිමිකම් කියන නුගදූගොඩ හෙවත් නුගදූව, සරත් අලහකෝන් සහ උපතිස්ස අලහකෝන් හිමිකම් කියන මුප්පනෙවත්ත සහ යෝගා රත්නවිභූෂණ හිමිකම් කියන නුගදූගොඩ හෙවත් නුගදූව; නැගෙනහිරට: සරත් අලහකෝන් සහ උපතිස්ස අලහකෝන් හිමිකම් කියන මුප්පනෙවත්ත සහ යෝගා රත්නවිභූෂණ හිමිකම් කියන නුගදූගොඩ හෙවත් නුගදූව; දකුණට: යෝගා රත්නවිභූෂණ සහ රේණුක මහේන්ද්‍ර දේවනාරායන හිමිකම් කියන නුගදූගොඩ හෙවත් නුගදූව සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා), චන්ද්‍රවති ලියනපතිරණ, ඩබ්ලිව්. ටී. මංජුල ප්‍රියන්ත සහ ඩබ්ලිව්. ටී. නාලක සමන් හිමිකම් කියන නුගදූගොඩ හෙවත් නුගදූව.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

යොමු අංකය 4-3/6/2017/එච්ඩබ්ලිව්/220.
2018 මාර්තු මස 23 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

04-744

 ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*